පියා තම දියණිය හා මනාලයාගේ බන්ධනය සංකේතවත් කරමින් වස්ත්‍ර කෙළවර එකට ගැට ගැසීම සිදු වෙයි. චාරිත්‍ර සිදු වන ස්ථානයේ මධ්‍යය වටා මනාල යුවළ දෑත් අල්ලාගෙන වට හතරක් රවුමට ගමන් කිරීමෙන් පසු දෙදෙනා අතර විවාහය සිදු වූවා සේ සැලකේ. ආගමික පූජකවරුන්ගේ ස්තෝත්‍ර ගායනයෙන් හා වෙනත් නොයෙක් වතාවත්වලින් ද ඔවුන්ගේ විවාහ මංගල චාරිත්‍ර සමන්විත වෙයි.

ජපන් ජාතිකයන් ජීවිතයේ විවිධ අවස්ථාවන්හිදී එක් එක් ආගමික වතාවත් සිදු කරන නමුත් මරණයේදී බොහෝ දුරට බෞද්ධ චාරිත්‍ර ඉටු කෙරේ. විවාහ මංගලයයකදී ඇතමුන් ක්‍රිස්තියානි ක්‍රමයට අනුව චාරිත්‍ර ඉටු කරන අතර බොහෝ දෙනා 'ෂින්තො' ආගමික දේවස්ථානවලදී සිය විවාහ සිදු කරති. එහිදී සාම්ප්‍රදායික චාරිත්‍ර සමූහයක් ඉටු කරනු ලැබේ. අතීතයේදී වැඩි වශයෙන්ම විවාහ මංගල්‍ය අවස්ථා සිදු වූයේ 'ෂින්තො' දේවස්ථානවලදීය. මනාලිය සුදු පැහැති වස්ත්‍රයෙන් සැරසෙන අතර හිස් වැස්ම ද එම වර්ණයම ගනී. හිස් පලඳනාවේ ඇති විවිධ ආහරණ වාසනාවන්ත විවාහ ජීවිතයකට සුබ පතුම් ගෙන එන දේ ලෙස සැලකේ. මනාලියගේ, තරමක් විශාල ප්‍රමාණයේ හිස් පළඳනාවේ එක් අරුතක් වන්නේ නැන්දම්මාගේ ඊර්ෂ්‍යාව අවම කරගැනීමයි, නැතහොත් ඒ සඳහා තම මුහුණේ රුව ආවරණය කර ගැනීමයි.

අනික් අතට ජපන් මනාලයින්ගේ ඇඳුමෙහි වැඩි වශයෙන් කළු පැහැයත් පහත කොටසෙහි දුඹුරු පැහැයත් දක්නට ඇත. 'හඔරි' සහ 'හකම' යන නම්වලින් එම ඇඳුමේ පහළ සහ උඩ කොටස් හැඳින්වෙයි. ඔවුන්ගේ විවාහයේදී නැතිවම බැරි පානයක් වන 'සකෙ' බීම ද එම චාරිත්‍රවල අත්‍යවශ්‍ය අංගයකි. පූජකවරයකු ඉදිරියේ 'සකෙ' පානය සිදු වෙයි. පළමුව මනාලිය, ඉතා කුඩා බඳුනක 'සකෙ' පානය කර ඉන් පසු මනාලයාට දෙන අතර ඔහු ද එයින් 'සකෙ' බීම මෙහිදී චාරිත්‍රානුකූලව සිදු වන්නකි. ප්‍රධාන ආගමික වතාවත් සහිත විවාහයෙන් පසුව පවත්වනු ලබන අලංකාර උත්සවයේදී මනාලිය රතු පැහැති 'කිමොනො' ඇඳුමකින් සැරසී සිටියි. මෙම විවාහ උත්සවවලදී අත්‍යවශ්‍ය අංගයක් වනුයේ ආරාධිත අමුත්තන් මනාල යුවළට මුදල් ත්‍යාග හෙවත් 'ගොෂුගි' ලබා දීමයි. ජපානයේ අද විවිධ අවස්ථාවලදී, විවාහවලදී මෙන්ම අවමංගල්‍ය අවස්ථාවලදී ද අමුත්තන් මුදලින් තෑගි පිරිනැමීම අත්‍යවශ්‍යයෙන් සිදු වන්නකි.

චීන ජාතිකයන්ගේ විවාහ උත්සව ද ඉස්තරම් ලෙස හා වර්ණවත් ලෙස පැවැත්වෙයි. විවාහයට පෙර මනාලියක් තම හිතවත් මිතුරු මිතුරියන් සමග කෙටි හෝ වැඩි වෙලාවක් ගත කරමින්, විවාහයෙන් පසුව අගිමි වන එම නිදහස් ඇසුර සංකේතවත් කරයි. විවාහය සිදු වන දිනයේදී මනාලයාගේ දෙමාපියන් තම පුත්‍රයාට ඇඳුම් පැලඳුම් ඇන්දවීම චාරිත්‍රයකි. විවාහය සිදු වන ස්ථානයට යාමට පෙර ඔහු මනාලියගේ නිවසට පිවිසෙයි. චීන ජාතිකයන්ට ආවේණික සිරිතක් වන රතු පැහැති කවරවල මුදල් හා තෑගි ඔතාගෙන ඒම මෙදින ද මනාලයා විසින් සිදු කෙරෙයි. මුලින්ම මෙම තෑගි හිමි කර ගනු ලබන්නේ මනාලියගේ මිතුරු මිතුරියන් විසිනි. තම මිතුරු ඇසුරෙන් මනාලිය මුදා හරිමින් මනාලයාට අයෙ අයත් කරගැනීමට ඉඩ ලබාදීම ගැන කෘතඥතාව පළ කිරීමේ සංකේතයක් ලෙස මෙම තෑගි දීම සැලකේ. ඇතැම් විවාහ මංගල්‍ය අවස්ථාවලදී මනාල යුවළ දෙපක්ෂයේම දෙමාපියන් ඉදිරියේ දණගසාගෙන ඔවුන්ට තේ පිරිනැමීම සිදු කෙරෙනුයේ තම විවාහයට දෙපසේම අවසරය ඉල්ලා සිටීමක් සංකේතවත් කරමිනි. මෙවැනි චාරිත්‍රවලට අනතුරුව උත්කර්ෂවත් ලෙස උත්සවය පැවැත්වෙයි. ඇතැම් චීන මනාලියන් තම විවාහ මංගල්‍යයේදී තුන්වතාවක් පමණ ඇඳුම් වෙනස් කරන බව ද කියවෙයි.

චීන ජාතික මනාල මනාලියන්ගේ මංගල සීනු හැඩවීම මේ අයුරින් සිදු වෙද්දී කොරියාවේ විවාහයන් සිදු කෙරෙන ආකාරයෙන් බිඳක් ද මෙහි ඇතුළත් කිරීම යෝග්‍යය. කොරියානු ජාතිකයන්ගේ විවා මඟුල් අද වන විට බෙහෙවින් බටහිර පන්නයට නැඹුරු වීමක් දැකගත හැකිය. මනාලිය බටහිර කාන්තාවගේ ඇඳුමට සමාන වන කොට ගවුමකින් ද මනාලයා බටහිර ඇඳුමෙන් ද සැරසී මඟුල් උත්සව පැවැත්වීම සිදු කෙරෙයි. ප්‍රධාන අංශ අවසන් වූ පසුව මනාල යුවළ සාම්ප්‍රදායික කොරියානු ඇඳුමෙන් සැරසෙති. දෙමාපියන්ට ආචාර සමාචාර දැක්වීම ද ඒ සමගම සිදු වෙයි. ආපසු එම වැඩිහිටියන්ගෙන් ඔවුන්ට ඇට වර්ග හා රස කැවිලි ලැබෙයි. එපමණක් නොව මුදල් තෑගි ද මනාල යුවළට දෙනු ඇත. මනාල යුවළට එසේ පිළිගැන්වෙන රසකැවිලි සහ ඇට වර්ග සංකේතවත් කරනුයේ ඔවුන්ට විවාහයෙන් ලැබෙන දරු සම්පත්ය. සාම්ප්‍රදායික සිරිත් අනුව මනාලයාගේ දෙමාපියන් විසින් කරනු ලැබෙනුයේ මනාලිය වෙතට ඇට වර්ග සහ මිදි හෝ වෙනත් පලතුරු විසි කිරීමය. ඒවායින් හැකි තරම් අය්‍ය තම ඇඳුමට වැටෙන සේ අල්ලා එකතු කරගනියි. වැඩි සංඛ්‍යාවක් එකතු කරගතහොත් එයින් හැඟෙන්නේ ඇයට දරු සම්පත් ඉතා හොඳ බවයි. වෙනත් සමාජවලින් අසන්නට නොලැබෙන අපූරු තොරතුරු ද කොරියානු විවා මඟුල්වලට සම්බන්ධව අසන්නට ලැබේ. මනාලයා මඟුල් උත්සවයේදී වැඩිපුර සිනාසුණහොත් ඔවුන්ට පළමු දරු සම්පත ලෙස දියණියක් ලැබේ යයි විශ්වාස කෙරේ.

ලෝකයේ අනිකුත් රටවල ද විවිධ වෙනස්කම් සහිත විවා මඟුල් සිරිත් දැකගත හැකිය. ජර්මනියේ ගැහැනු දරුවකැගේ උපතේදී වැඩිහිටියෝ තම ගෙවත්තෙහි, දැරියට ගොරවයක් ලෙස විවිධ පැළ සිටුවති. ඇය විවාහ වන වියට පැමිණි විට එම ගස් වැකුණා එම මුදල ඇයගේ දෑවැද්ද ලෙස දෙනු ලැබේ. ජර්මනියටම විශේෂ වූ චාරිත්‍රයක් නම් විවාහයට පෙර මනාලයාගේ හා මනාලියගේ මිතුරු මිතුරියන් හා පවුල්වල අය එකතුව මංගල්‍ය පුවත්පතක් පිළියෙල කිරීමයි. එය සාමාන්‍ය පුවත්පතක් හෝ කුඩා පොතක් විය හැකිය. ඊට ඇතුළත් කරනු ලැබෙන්නේ විවාහාපේක්ෂක දෙදෙනාගේ ඡායාරූප හා ඔවුන්ට අදාළ වෙනත් විවිධ ලිපි ලේඛනය. විවාහ උත්සවයේදී අමුත්තන් අතර මෙම පුවත්පත විකිණීමෙන් මධුසමය වෙනුවෙන් වැය වන මුදල් සොයාගැනෙන බව කියවේ. පොදුවේ ගත් විට ජර්මනියේ මෙන්ම ලෝකයේ වෙනත් බොහෝ රටවල ද විවාහය වැදගත් අවස්ථාවක් වන අතර ඒ හා බැඳුණ විවිධාකාර චාරිත්‍ර සමූහයක් දක්නට ඇත. මේ සියලු ක්‍රියාවන්ගෙන් ගම්‍ය වන එක් කරුණක් වනුයේ පුද්ගලයකුගේ ජීවිතයේ වැදගත්ම අවස්ථාවක් තමතමන්ට රුචි වන පරිදි සුන්දර ලෙස හා ප්‍රීතිමත් ලෙස ගෙවන්නට හැම දෙනාම පාහේ උනන්දුවක් දක්වන බවයි.

මේ නිසා පුද්ගලයන් අතර මෙන්ම පවුල් අතරත්, ඥාති සමූහයා අතරත් තමතමන්ට අදාළ වන සේ චාරිත්‍රානුකූලවත්, විචිත්‍ර ලෙසත් විවා මඟුල් සිදු වන අයුරු දැකගත හැකිය. වෙනස් වෙමින් යන නූතන ලෝකයේ අප දකින කවර විපර්යාසයන් මධ්‍යයේ වුවද, විවාහය අත්‍යවශ්‍ය සමාජ සංස්ථාවක් සේ සැළකීම පිළිබඳ මතවාදයක් නොමැති තරමිය. එපමණක් නොව, පුද්ගලයකුගේ ජීවන ගමනේ වැදගත් සන්ධිස්ථානයක් වන විවාහයේදී බොහෝ දුරට සමාජ සම්ප්‍රදායයන් හා චාරිත්‍ර අනුගමනය කිරීමත්, විචිත්‍ර ලෙස ඒවා ඉටු කිරීමත් අද මෙන්ම ඉදිරියටත් සිදු වන බවට ද සැකයක් නැත.

Astrological Services
By Ramya Attygalla
(over 20 years' experience)

Casting of Horoscope (Dala Kendera and/or Bawa Kendera)
Reading of Horoscope (Palapala)
Nekath for all occassions
Matching for compatibility (Porondam)
We do not use any software; all work is carried out by traditional methods.

Readings will be sent via email, but please call if you require further details.

Email: ramyaattygalla@gmail.com
Mobile Phone Numbers: 00 11 94 7117 90367 or 00 11 94 1127 00481
Local Inquiries: Chandini on 0422 31 2110 or 03 9798 6140
Very reasonable charges.
Payments to a CBA Bank Account or via PayPal.

IMMIGRATION LAW @
Australian Immigration Law firm of the Sri Lankan Community

We are proud to have lead the way for others to follow...

Professional Immigration Legal Services
Legal Advice in simple to complex Immigration matters

- Skill Assessments
- State Sponsorships Expression of Interest (EOI)
- Visa Lodgments
- Employer Sponsorships & Nominations
- Migration Review Tribunal Appeals
- Federal Court Appeals
- Ministerial Appeals

General Skill Migration
457 Visas
Employer Nominated Migration
Student Visas
Graduate Skill Visas
Permanent Residence Pathways
Spouse Visas
Contributory Parent Visas
Business Migration
Resident Return Visas

A Team of Qualified & Experienced Lawyers & Registered Migration Agents

Susantha Katugampala
Principal
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
MARN: 9601070

LAW INSTITUTE OF VICTORIA ACCREDITED SPECIALIST

FAIRFIELDS LAWYERS
AUSTRALIA GATEWAY
Australian Immigration Law Advisory

10 Morrison Place
East Melbourne 3002
Australia
T: 03 9650 4557
1300 888 331
M: 0417 851 041

Suite 602, Hilton Colombo Residence 200
Union Place, Colombo 2
Sri Lanka
T: +94 11 2300 627
M:+94 777 347 670

info@fairfieldslawyers.com

We Deliver Results...